පුවත් වාර්තාවක් හෝ විශේෂාංග ලිපියක් ප්‍රකාශයට පත් වීමට පෙර ගුණාත්මක පිරිපහදු ක්‍රියාවලියක් ඔස්සේ යමින් සංස්කරණය වීම සිදුවිය යුතු කරුණකි. කෙසේ නමුත්, වර්තමානය වන විට වාර්තාව හෝ ලිපිය ලියූ මාධ්‍යවේදියා විසින් නොව පුවත්පත් කතුවරයෙකු විසින් යොදනා සිරස්තල ගැටළුකාරී වීම හා ආචාර ධාර්මික උල්ලංඝනයන් වීම, සැබෑ ප්‍රශ්නයක් බව මාධ්‍යවේදීන් අප වෙත ඉදිරිපත් කර ඇති අදහස් අනුව පැහැදිලි වේ.

මෙම ප්‍රශ්නයට එක් උදාහරණයක් ලෙසින් "විසිතුන් වසරකට පසු හෙළිවන ක්ලින්ටන්-මොනිකා ආදර කතාවේ රස රහස්" යන සිරස්තලයෙන් යුතුව අරුණ (03/09) පුවත්පතේ පළවී ඇති ලිපිය කතිකාවට ගත හැක. මෙම සිරස්තලයේ "රස රහස්" යන්න වඩාත් විශාල අකුරු වලින් මුද්‍රණය වී ඇති බවද නිරීක්ෂණය කළ හැක.

සැබවින්ම මෙම ලිපිය මගින් මොනිකා ලෙවින්ස්කි හා බිල් ක්ලින්ටන් සම්බන්ධ සිදුවීම ප්‍රස්තුත කොට ගැනී තිබුණත්, ඒ ඔස්සේ එම වඩාත් විශාල සමාජ ගැටළුවක් පිළිබඳව සාරගර්භ ලෙසින් සාකච්ඡා කරයි. එනමුත්, එම ලිපියට යෙදෙන භාවාතිශය සිරස්තලය ඔස්සේ එම ලිපිය හුදු ඕපාදූපයක් බවට ලඝු කොට දක්වයි. එවැනි භාවාතිශය සිරස්තලයක් යොදාගැනීම ඔස්සේ පාඨකයා නොමඟ යැවීමක්ද සිදුවේ. එය මාධ්‍ය ආචාර ධර්මයන් උල්ලංඝනය කිරීමක්ද බව කිව යුතුවේ.

#MediaEthicsSL #lka #SinhalaPress #Aruna